<u>නිපුණතාවය 13 අදාල පසුගිය විභාග ප්‍රශ්න</u>

2011

I. පූර්ව ප්‍රසව සංවර්ධනයේ අවධි 03 හඳුන්වන්න.

II. ආර්තව චක්‍රය හඳුන්වන්න.

III. ළදරුවාගේ පෝෂණය සඳහා මව්කිරි ලබා දීමෙන් දරුවාට හා මවට වාසි සැලසේ. එම වාසි විස්තර කරන්න.

2012

I. ගර්භණී මවක් විසින් පිළිපැදිය යුතු සෞඛ්‍ය පුරුදු 03 ක් දක්වන්න.

II. ළදරුවෙකුට අතිරේක ආහාර ලබා දීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 03ක් සඳහන් කර ඒ එකිනෙකට හේතු දක්වන්න.

III. පූර්ව ප්‍රසව අවධිය තුල සිදුවන අධිරෝපණය පැහැදිලි කරන්න.

2013

I. ගර්භණී මවක් පූර්ව ප්‍රසව සායනයට සහභාගී වීම වැදගත් වීමට හේතු වන කරුණු පැහැදිලි කරන්න.

II. නව ජීවියෙකු ඇති වීම සඳහා පහත දැක්වෙන ඉන්ද්‍රියයන්හි කෘත්‍ය පැහැදිලි කරන්න.

(a) වෘෂණ (b) පැලෝපීය නාල

III. චාලක වර්ධනය හඳුන්වන්න.

IV. ළදරු අවධිය තුල චාලක වර්ධනයේ වේගවත් බවක් පෙන්නුම් කරයි. උදාහරණ 02 ක් මඟින් මෙය පැහැදිලි කරන්න.

V. පහත සඳහන් දෑ හඳුන්වන්න

(a) ආර්ථවහරණය (b) ඊස්ට්‍රජන්

(c) යුක්තානුව (d) පෙකණිවැල